**වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව**
**වවුනියාව දිස්ත්‍රික්කය**
------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 22 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ). ඉරට්ටේපෙරියකුලම, අග්බෝපුර සහ මාමඩුවෙ පිහිටි ගොඩනැගිලි 03 හි කඩ කාමර තක්සේරු කර ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ආ). ලංකා බැංකුවේ රු. මි. 2.5 ක ස්ථාවර තැන්පතුව සඳහා සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු පොලිය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

ඇ). ප්‍රාදේශීය සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 09 ක වටිනාකම තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

ඈ). කොන්ත්‍රාත්කරුවන්ගෙන් තැන්පතු ලෙස ලද රු. 253,412 ක් ආපසු ගෙවිය යුතු තැන්පතු යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

ඉ). 2015 වර්ෂය සඳහා වැඩිපුර ගෙවන ලද විගණන ගාස්තු රු. 49,465 ක් සමුච්චිත අරමුදලට හර නොකර සමාලෝචිත වර්ෂයේ වියදමට ගලපා තිබීමෙන් අතිරික්තය එම ප්‍රමාණයෙන් ඌනගණනය වී තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**
--------------------------

බැංකු ශේෂ සනාථන ලිපි අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු 07 ක ශේෂයන්ගේ එකතුව රු. 7,232,948 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. 7,264,642 ක් වූ බැවින් රු. 31,694 ක වෙනසක් පැවතුණි.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් හතරක වටිනාකමරු. 4,913,425ක් වූ අතර එම වටිනාකම තුල වසරකට වඩා වැඩි කාලයක් හිඟව තිබූ වටිනාකම රු. 2,062,539 ක් විය.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ). රු. 980,095 ක් වූ පුස්තකාල පොත් වල වටිනාකම සනාථ කිරීමට විස්තරාත්මක උප ලේඛණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ආ). රු.88,873,621 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය තහවුරු කිරීමේ ලිපි ලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.5 නීතිරීති හා රෙගුලාසි වලට අනුකුල නොවීම**

---------------------------------------------------

පහත දැක්වෙන නීති රීති හා රෙගුලාසි වලට හා කළමනාකරණ තිරණවලට අනුකුල නොවිම් විගණනයේදි නිරීක්ෂණය විය.

| <u>**නීතිරීති රෙගුලාසි වලට යොමුව**</u> | <u>**අනුකූල නොවීම**</u> |
|---|---|
| අ). 1988 ප්‍රාදේශිය සභා රිති සංග්‍රහය (මුල්‍ය හා පරිපාලන) | |
| 5(7) රීතිය | මූල්‍ය හා ගබඩා කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයන් පවත්වා නොතිබුණි |
| 165 රීතිය | ප්‍රධාන ලෙජරයක් පවත්වා නොගැනීම. |
| 166 රීතිය | ජ'නලයක් පවත්වා නොගැනීම. |
| 65 රීතිය | කාල සීමාව අවසානයේ ආදායම් ලිපිකරු ගෙවීම් පැහැර හරින තැනැත්තන්ගේ නාම ලේඛනයක් පිළියෙල කර ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| 130 රීතිය | පී.එස්. 8 අනුව සුළු මුදල් පොත යාවත්කාලීන කර නොතිබීම. |
| 152 රීතිය | පී.එස්. 6 අනුව මාසික ලැබීම් ප්‍රකාශයක් පවත්වා නොගැනීම. |
| 155 රීතිය | පී.එස්. 10 අනුව ප්‍රධාන මුදල් පොත පවත්වා නොගැනීම. |
| 159 රීතිය | පී.එස්. 15 අනුව මාසික ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය පවත්වා නොගැනීම. |
| 163 රීතිය | පී.එස්. 19 අනුව සාරාංශ ආදායම් ලේඛනය පවත්වා නොගැනීම. |

| | |
|---|---|
| 169 රීතිය | පී.එස්. 40 හා 43 අනුව පිළිවෙලින් ඇස්තමේන්තු ලෙජරය හා වැඩ විස්තර මිනුම් පොත පවත්වා නොගැනීම. |
| 180 රීතිය | මුදල් හෝ ගබඩා කටයුතු භාරව ක්‍රියා කරන නිලධාරීන් හෝ ආදායම් එකතු කිරීමේ කටයුතු හා සම්බන්ධ රාජකාරී ඉටු කරන නිලධාරීන් විසින් ඇප තැන්පත් කර නොතිබුණි. |
| 193 රීතිය | අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන හා පරිපූරක සම්මත සසඳා බලනකල එක් එක් ආදායම් විෂයන් යටතේ හා එක් එක් වැය විෂය යටතේ ප්‍රකාශයන්, අතිරික්තයන් හෝ වියදම් නොකොට ඉතිරිව ඇති ශේෂය පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයන්ද සමඟ සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| 217 රීතිය | පී.එස්. 46 අනුව සභාව විසින් ප්‍රයොජනයට ගන්නා හා සභාව විසින් පදිංචියට ගන්නා ලද සියළුම ඉඩම් හා ගොඩනැගිළි පිළිබඳව ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

ආ). ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 133 හා 134 | සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම හා අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 570 | සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබඳව ලැයිස්තු සකස් කර විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 571(2) හා (3) | ඉකුත් වූ තැන්පතු රජයේ ආදායමට බැර කිරීම හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීම සිදුකල යුතු වුවත් රු.499,303 ක් වටිනා ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| ඇ). 2002 ජුලි 30 දිනැති අංක 364 (3) දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ | එක් එක් මාසය සඳහා ගෙවනු ලැබූ එකතු කල අගය මත බදු (VAT) පිළිබඳ විස්තර විගණකාධිපතිට පිටපතක් සහිතව ඊලඟ මාසයේ 15 දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතු වුවත් 2014 වර්ෂයේ ගෙවනු ලැබූ රු. 2,777,659 ක් හා 2015 වර්ෂය සඳහා ගෙවනු ලැබූ රු.2,050,327ක් හා සමාලෝචිත වර්ෂය සඳහා ගෙවනු ලැබූ රු. 2,686,465 ක් සම්බන්ධව ඉහත පරිදි කටයුතු කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු. 1,691,900 ක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 4,158,148 ක් විය.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදමක් ලෙස සටහන් කල යුතු රු. 5,945,707 ක් පුනරාවර්තන වියදමක් ලෙස සටහන් කිරීම නිසා ඉකුත් වර්ෂයේ රු. 4,158,148 ක් වූ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම, සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා ආදායම රු. 1,691,900 කින් අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3** **ආදායම් පරිපාලනය**

----------------------

**2.3.1** **ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

--------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123(2) වගන්ති ප්‍රකාරව, පිළියෙල කරන සෑම අතුරු ව්‍යවස්ථාවක්ම, මේ වගන්තියේ (1) වන උප වගන්තිය මඟින් නියම කර ඇති නිවේදනයත් සමඟ ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවත්, අතුරු ව්‍යවස්ථාව පිළියෙල කර ගැසට් පත්‍රයේ පල කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ආදායම් රැස්කර තිබුණි.

**2.3.2** **බදු කුලී**

---------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ). පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරණ චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර කුලී, යටත් පිරිසෙයින් වසර 5 කට වරක් වත් තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කලයුතු වුවත් එසේ නොකොට මිල ගණන් කැඳවීමක් සිදුකර සභාව සතු කඩකාමර 13 ක් කුලියට දී තිබුණි.

ආ). සමාලෝචිත වර්ෂයේ දී කඩකාමර 7ක් වර්ෂය පුරාම කුලියට දීමට කටයුතු නොකිරීම නිසා රු. 96,900 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

**2.3.3** **බලපත්‍ර ගාස්තු**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ). ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත දුරකථන කුළුණු 7ක් සඳහා ස්ථාපිත දිනයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වෙළඳ බලපත්‍ර ගාස්තු රු. 114,000 අයකළ යුතු වුවත්, එකී ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (X) (ආ) වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙන්දන් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

ඇ). ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන, පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබාගතයුතු ව්‍යාපාරික ස්ථාන සම්බන්ධයෙන් හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි.

**2.3.4 වෙනත් ආදායම්**

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (VII) (ඊ) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 160,500 ක් වූ දැන්වීම් පුවරු 49 ක් සඳහා ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

ආ). සමාලෝචිත වර්ෂය සඳහා සභා බල ප්‍රදේශය තුළ පිහිටි නළ ළිං 210 කින් ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

ඇ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 47 වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශය තුළ ඉදිකිරීම් සිදු කිරීම සඳහා අවසර ලබා දීමක් සිදු කර නොතිබුණු අතර, ගාස්තුවක් ද අය කර නොතිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ). විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ විසින් සමාලෝචිත වර්ෂයේ දී සභාවේ ලේකම් වෙත එවා ඇති මුදල රු. 2,852,677 ක් වූ අතර දෙසැම්බර් 31 දිනට හිඟ මුදල රු. 803,084 ක් විය.

ආ). මුද්දර ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේ දී සභාවේ ලේකම් වෙත එවා ඇති මුදල රු. 144,045 ක් වූ අතර දෙසැම්බර් 31 දිනට හිඟ මුදල රු. 2,578,357 ක් විය.

**2.4 කලමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ 2013 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින රියදුරු තනතුරු 04 ක් හා වෙනත් තනතුරු 04ක් මේ වන තෙක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආ). සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 112,347 ක ණය ශේෂය 2013 වර්ෂය අවසානයේ සිට පවතින අතර 2014,2015 හා 2016 යන වර්ෂවලදී ඉන් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි.

ඇ). 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අපහරණය කිරීමට නිර්දේශ කල භාණ්ඩ 19 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ). පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සභාව සතු සංස්කෘතික මධ්‍යස්ථානයේ පරිහරණය සඳහා වටිනාකම රු. 2,223,032 ක් වූ කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. මෙම මධ්‍යස්ථානය ආරම්භ කිරීමේ නිශ්චිත දිනයක් තීරණය නොකර මධ්‍යස්ථානය සඳහා උක්ත භාණ්ඩ මිලට ගැනීම නිසා 2017 අප්‍රේල් 27 දින වන විටත් වසර දෙකක කාලයක් මෙම භාණ්ඩ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.තවද එකී භාණ්ඩ වල වගකීම් කාලයද වසර 02 ක ඉක්මවා තිබුණි.

ආ). ප්‍රාදේශීය සභාවේ මෙහෙවර ප්‍රකාශය අනුව බල ප්‍රදේශයේ පූර්ණ සංවර්ධනයක් කරා යා යුතු බැවින් ප්‍රතිලාභ පොදු මහජනතාවට ලබා දීමට කටයුතු කළ යුතු වුවත් සභාව විසින් සභා අරමුදලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී රු. 34,702ක් සංවර්ධන කටයුතු සඳහා වැය කර තිබුණි. ප්‍රාදේශීය සභාවේ අරමුදල් පරීක්ෂාවේදී ස්ථාවර තැන්පතු වල රු. 7,264,642 ක් ආයොජනය කර තිබූ අතර සෑම මසකම බැංකු ගිණුමේ රු. මිලියන 06ත් 09ත් අතර පරාසයක අරමුදල් ද පැවතුණි.

## 2.6 නිෂ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ). සභාව සතුව රෝද 4 ට්‍රැක්ටර් රථ 08 ක් හා රෝද 2 අත්ට්‍රැක්ටර් 03 ක් පවතින අතර එකී ට්‍රැක්ටර් රථවලින් 2016 දෙසැම්බර් 31 දින වන විට, ට්‍රැක්ටර් රථයක් පමණක් භාවිතා කර රු. 27,230 ක් පමණ උපයාගෙන තිබුණි.

ආ). සභාව සතුව වාහන 22 ක් පවතින නමුත් එකී සියලුම වාහන ධාවනය කිරීම සඳහා ඇත්තේ එක් රියදුරෙකු පමණි.

ඇ). යන්ත්‍ර ක්‍රියාකරුවන් නොමැතිවීම නිසා සභාව සතු යන්ත්‍ර 3 ක් වෙනත් සේවකයින් විසින් ක්‍රියාත්මක කරමින් පැවතුණි.

ඈ). ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථානගත කර ඇති සතිපොළවල් 03 ක් ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේ දී රු. 4,237,251 ක් වැයකර තිබූ නමුත් 2017 අප්‍රේල් 28 දින වන විටත් ඒවා පාවිච්චියට ගෙන නොතිබුණි.

ඉ). සභාව සතු මරුටි ජීප් රථය 2013 වර්ෂයේ සිටද, ටිපර් රථයක් හා බවුසර් රථයක් 2014 වර්ෂයේ සිටද, MD 90 දරන යතුරු පැදිය අවුරුදු 21 ක පමණ සිට ප්‍රයෝජනයට නොගෙන තිබුණි.

## 2.7 කොන්ත්‍රාත් පරිපාලනය

### (අ) ප්‍රාදේශීය සභාවේ නව කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම - රු. 14,926,848

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(I). ඉදිකිරීම් සැලසුම් කිරීමේදී ඉහල මහලයට බිම් උළු (Floor Tile) ඇතිරීම සඳහා ඇස්තමේන්තු කර නොතිබියදී අතිරේක වැඩ යටතේ වටිනාකම රු. 850,500 ක ලිස්සන බිම් උළු (Skip Tile) අතුරා තිබීම මත ප්‍රසම්පාදනයේ විවෘත මිල ගණන් වලින් ලබාගත හැකි වාසිය ලබාගත නොහැකි වී තිබුණි.

(II). ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක G-11 යටතේ ලිස්සන උළු (Skip Tile) ඇතිරීමට නිර්දේශ කර නොතිබියදී වටිනාකම රු. 783,700 ක ලිස්සන බිම් උළු (Skip Tile) අතුරා තිබුණි. එමෙන්ම එකී

ටයිල් ලිස්සන තත්වයේ පවතින බැවින් ලිස්සා වැටීමේ අවදානමෙන් බැහැරවිය නොහැකි බැව් නිරීක්ෂණය විය.

**(ආ) සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම**

---

සංස්කෘතික මධ්‍යස්ථානයේ දෙවන අදියර ඉදිකිරීමට රු. 6,000,000 කට ගිවිසුම් ගතව රු. 5,400,890 ක් පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයකට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(I). ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 45, 46 හා 47 යටතේ අත්වැටවල් සපයා සවිකිරීම වෙනුවෙන් පිළිවෙලින් රු. 460,382 ක් ගෙවා තිබුණු නමුත් එකී වැටවල් නිසි පරිදි සවි නොකිරීම හේතුවෙන් සෙලවීමට ලක් වී තිබුණි.

(II). ඇස්තමේන්තු වැඩ විෂ අංක 68 පරිදි රු. 693,000 වියදම් කර ඉහල මහලේ කාමර 10 සඳහා ජනෙල් සවිකර තිබුණි. මෙකී ජනෙල් සඳහා යකඩ කූරු හෝ Grill සවිකිරීම අත්‍යාවශ්‍ය බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද එකී අවශ්‍යතාවය ඉටුනොවීම තුළින් නේවාසිකයන්ගේ ආරක්ෂාව පිළිබඳ දැඩි අවදානමක් පැවතුණි.

**(ඇ) මහමයිලන්කුලම ටාස්ෆෝමර් මාර්ගය තාර දමා ඉදිකිරීම - රු. 1,065,053**

---

(I). ඇස්තමේන්තුවේ අනු අංක 07 අනුව පාදම බොරළු දමා තැලිය යුතු වුවත් බොරළු තලා නොතිබූ නිසා පාදම වැස්සට සේදී ගොස් තිබුණි.

(II). ඇස්තමේන්තුවට අනුව පාරේ පළල මීටර් 3.3ක් විය යුතුව තිබූ නමුත් භෞතික පරීක්ෂාවේදී පාරේ පළල මීටර් 2.7 සිට මීටර් 2.8 පරාසයක තිබුණු බව අණාවරණය විය.

(III). ඇස්තමේන්තුවට අනුව පාදමේ එක් පසක පළල අඩි 02 ක් වියයුතු වුවද අඩි 1ත්, 1.5ත් අතර පරාසයකට පාදම දමා තිබීම තුළින් පාරේ පැවැත්මට හානියක් සිදු වීමට ඉඩකඩ පැවතුණි.

**(ඈ) මහකච්චකුඩි, පිරප්පන්මඩුවට මාර්ගය තාර දමා ඉදිකිරීම - රු. 2,189,175**

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(I). ඇස්තමේන්තුවේ අනු අංක 10 අනුව පාදම බොරළු දමා තැලිය යුතු වුවත්, බොරළු තලා නොතිබූ නිසා පාදම වැස්සට සේදී ගොස් තිබුණි.

(II). මාර්ගයේ සම්පූර්ණ දුර වන මීටර් 390 න් මීටර් 200 ක පමණ දුර ප්‍රමාණයක් පොළවට කිඳා බැස තිබුණි.

(III). ඇස්තමේන්තුවට අනුව පාදමේ එක් පසක පළල අඩි 2.5 ක් විය යුතු වුවද අඩි 1.5 ත් අඩි 2 ත් අතර පරාසයකට පාදම දමා තිබීම තුළින් ඇස්තමේන්තුවට අනුකූලව ක්‍රියානොකිරීම තුළින් පාරේ පැවැත්මට හානියක් සිදු නොවන බවට බැහැර කල නොහැකි විය.

**(ඉ) ඉරට්ටේපෙරියකුලම පොදු ළිඳ ඉදිකිරීම - රු. 485,700**

---

(I). පොදු ළිඳක් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් ළිඳ ඉදි කර ඇත්තේ සභාවේ සභිකයකුගේ පෞද්ගලික ඉඩමකය.

(II). ඇස්තමේන්තුවේ අනු අංක 17, 18 හා 20 යටතේ පිළිවෙලින් ලණුවක්, බාල්දි 02ක් හා නාම පුවරුව සපයා සවිකර නොතිබූ නමුත් ඒ වෙනුවෙන් පිළිවෙලින් රු. 1,548 ක්, රු. 2,052 ක් හා රු. 10,000 ගෙවීම් අනුමත කර තිබුණි.

**2.8 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**2.8.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ). කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවේ 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA /2009 (2) දරන චක්‍රලේඛය අනුව අභ්‍යන්තර විගණන නිළධාරියා විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

ආ). තවද කළමණාකරන විගණන දෙපාර්තුමේන්තුවේ 2012 ජනවාරි මස 13 දිනැති DMA/2012 /101 දරණ චක්‍රලේඛය මඟින් අභ්‍යන්තර විගණන කටයුතු කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා පරිගණක ගත තොරතුරු පද්ධතියක් තුල (CIS) අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කිරීම සිදු කලයුතු බවට මාර්ගෝපදේශ හා ප්‍රශ්නාවලියක් හඳුන්වා දී තිබුණද අදාල චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි.

**2.9 පිළිතුරු නොදුන් විගණන විමසුම**

2017 ජුනි 05 දින වන විට 2015 වර්ෂයට අදාළ විගණන විමසුම් තුනකට හා 2016 වර්ෂයට අදාළ විගණන විමසුම් තුනකට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**3. පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින්වර ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහිද විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) රථවාහන පරිපාලනය

(ඉ) අභ්‍යන්තර පාලනය